**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

**ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ පළමු (I) වන ශ්‍රේණියේ අධිලේඛන සංරක්ෂක හා ශ්‍රව්‍ය දෘශ්‍ය සංරක්ෂක නිලධාරීන් සේවා පළපුරුද්ද හා කුසලතාවය මත විශේෂ ශ්‍රේණියට උසස් කිරීම**

ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ විශේෂ ශ්‍රේණියේ පුරප්පාඩුව පවතින ප්‍රධාන සංරක්ෂණ නිලධාරී (අධිලේඛන / ශ්‍රව්‍ය දෘශ්‍ය) තනතුරු සඳහා සංශෝධිත, 2017.11.28 දිනැති බඳවා ගැනීමේ පටිපාටිය ප්‍රකාර ව සේවා පළපුරුද්ද හා කුසලතාවය මත උසස්කිරීම සඳහා අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට, පහත සුදුසුකම් සපුරා ඇති ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ සක්‍රීය සේවයේ නියුතු නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. සුදුසුකම්

1.1 පළපුරුද්ද

| තනතුරු නාමය | අවශ්‍ය පළපුරුද්ද |
|---|---|
| 1.ප්‍රධාන සංරක්ෂණ නිලධාරී (අධිලේඛන) | ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ අධිලේඛන සංරක්ෂණ විෂය ක්ෂේත්‍රයේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික (MN-03) සේවා ගණයේ I වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර හය (06) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා නියමිත වැටුප් වර්ධක හය (06) ම උපයාගෙන තිබීම |
| 2. ප්‍රධාන සංරක්ෂණ නිලධාරී (ශ්‍රව්‍ය දෘශ්‍ය) | ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ ශ්‍රව්‍ය දෘශ්‍ය සංරක්ෂණ විෂය ක්ෂේත්‍රයේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික (MN-03) සේවා ගණයේ I වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර හය (06) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා නියමිත වැටුප් වර්ධක හය (06) ම උපයාගෙන තිබීම |

ඉහත වගුවේ සඳහන් තොරතුරු සඳහා විශේෂිතව සඳහන් කර ඇති කිසියම් විෂය ක්ෂේත්‍රයකට අදාළව අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික (MN-03) සේවා ගණයේ I වන ශ්‍රේණියේ නිලධරයන් සේවයේ නොමැති අවස්ථාවලදී පමණක් පුරප්පාඩු සම්පූර්ණ කිරීමේ අවශ්‍යතාව මත, එකී විෂය ක්ෂේත්‍රය පිළිබඳව පුහුණුවීම් ලබා ඇති අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික (MN-03) සේවා ගණයේ I වන ශ්‍රේණියේ වසර හයක (06) සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සහ නියමිත වැටුප් වර්ධක 06ක් උපයාගෙන ඇති අධිලේඛන විෂය ක්ෂේත්‍රයේ නිලධරයන්ගෙන් අයදුම්පත් කැඳවා පහත 1.2 හා 1.3 යටතේ සඳහන් අනෙකුත් සුදුසුකම් සම්පූර්ණකර ඇති නිලධරයන් කුසලතා ධාරාව යටතේ බඳවාගනු ලැබේ.

1.2 කායික සුදුසුකම් : සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරී ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

1.3 වෙනත් :

I. උසස් කිරීම සඳහා සුදුසුකම් පරීක්ෂා කරනු ලබන දිනට රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය. (සුදුසුකම් පරීක්ෂා කිරීමේ දින සිට සම්මුඛ පරීක්ෂණ දිනය දක්වා ද විනය දඬුවම් ලබා නොමැති බවට වන නිර්දේශය ආයතන ප්‍රධානියා විසින් ඉදිරිපත් කළ යුතු ය.)

II. අනුමත කාර්ය සාධන ඇගයීමේ පටිපාටියට අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර හය (06) තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම

III. අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික (MN-03) සේවා ගණයෙහි I වන ශ්‍රේණියට නියමිත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වී තිබීම

IV. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් වන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

02. වැටුප්

වැටුප් කේත අංකය : MN7 – 2016

වැටුප් පරිමාණය : රු. 41,580 – 11 × 755 – 18 × 1030 – රු. 68,425/- කි.

03. උසස් කිරීමේ ක්‍රමය

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන සේවා පළපුරුද්ද හා කුසලතාවය සඳහා ලකුණු ලබා දෙන යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත අදාළ සෙසු අවශ්‍යතාවයන් ද සම්පූර්ණ කර ඇති බවට පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කර තහවුරු කර ගැනීමෙන් අනතුරුව යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ කුසලතාවයේ අනුපිළිවෙල මත සහ පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව විශේෂ ශ්‍රේණියට උසස් කිරීම පත්කිරීම් බලධරයා විසින් සිදු කරනු ලබයි.

උසස්කිරීම ක්‍රියාත්මක වන දිනය සම්මුඛ පරීක්ෂණය පවත්වන දිනය වනු ඇත.

3.1 සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබාදීමේ පටිපාටිය පහත පරිදි වේ.

| **ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර** | **උපරිම ලකුණු ප්‍රමාණය** |
|---|---|
| 1. සේවා පළපුරුද්ද සඳහා ලකුණු<br><br>• ප්‍රධාන සංරක්ෂණ නිලධාරී (අධිලේඛන / ශ්‍රව්‍ය දෘශ්‍ය) තනතුර සඳහා<br>ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ අධිලේඛන / ශ්‍රව්‍ය දෘශ්‍ය සංරක්ෂණ විෂය ක්ෂේත්‍රයේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික (MN-03) සේවා ගණයේ I වන ශ්‍රේණියේ වසර හය (06) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කිරීමෙන් පසු අමතර සේවා කාලය සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2019 අනුව කටයුතු කරනු ලැබේ.<br><br>වැඩිම අමතර සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සහිත නිලධාරියාට සේවා පළපුරුද්ද සඳහා වෙන් කර ඇති ඉහළම ලකුණු ප්‍රමාණය ලබා දෙන අතර සෙසු නිලධාරීන්ට පහත ආකාරයට ලකුණු ලබා දෙනු ලැබේ.<br><br>සේවා පළපුරුද්ද සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු<br>————————————————<br>එම ශ්‍රේණියේ වැඩිම අමතර සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සහිත නිලධාරියාගේ සේවා කාලය<br>**(අවුරුදු x 12 + මාස)**<br><br>**X** අදාළ නිලධාරියාගේ අමතර සක්‍රීය හා සතුටුදායක සේවා කාලය **(අවුරුදු x 12 + මාස)** | 50 |
| 2. කුසලතාවය සඳහා ලකුණු<br><br>• අධීක්ෂණ හැකියාව<br>(සේවා සහතිකයක් මඟින් සනාථ කරනු ලබන, අංශ අධීක්ෂණය කර ඇති මාස තුනකට ලකුණු 01 බැගින්) | 05 |
| • විෂය පිළිබඳ ලබා ඇති විශේෂ පුහුණුවීම්<br>(සහතිකපත් මඟින් සනාථ කරනු ලබන, එක් පුහුණුවකට;)<br>පුහුණුව මාස 01 < ලකුණු 10<br>මාස 01 > සති 02 ලකුණු 05 බැගින්<br>සති 02 ට අඩු ලකුණු 0.5 බැගින් (උපරිම ලකුණු 10 ක්) | 10 |
| • ඉටු කර ඇති විශේෂ රාජකාරී<br>පුහුණු වැඩසටහන් මෙහෙයවීම (ලකුණු 10)<br>(ආයතන ප්‍රධානී විසින් නිකුත් කරන ලද සහතිකයක් මඟින් සනාථ කරනු ලබන | 15 |

| | |
|---|---|
| එක් පුහුණුවකට ලකුණු 2 බැගින්)<br><br>ලේඛන සමීක්ෂණ රාජකාරී (ලකුණු 05)<br>(අදාළ ආයතන වෙත ඉදිරිපත් කර ඇති වාර්තා අනුව එක් සමීක්ෂණයකට ලකුණු 01 බැගින්)<br><br>• ප්‍රශංසා<br>(පොදු 230 බී ආකෘතිය අනුව දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් ලබා ඇති ප්‍රශංසාවකට ලකුණු 01 බැගින්)<br><br>• කාර්ය සාධනය<br>ආසන්නම වසර 05ක කාර්ය සාධනය<br>සතුටුදායක - 0.5<br>හොඳයි - 1<br>ඉතා හොඳයි - 2<br><br>* කුසලතාවය සඳහා ආයතන ප්‍රධානියා විසින් සත්‍ය පිටපත් බවට සහතික කර සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කරන ලේඛන සඳහා පමණක් ලකුණු ප්‍රදානය කරනු ලැබේ. | 05<br><br>10 |
| 3. සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාව<br><br>a) පෙන්නුම් කරන ලද නායකත්ව කුසලතා (ලකුණු 02)<br>b) භාෂා හැකියාව (ලකුණු 02)<br>c) සන්නිවේදන හැකියාව (ලකුණු 01) | 05 |
| | 100 |

2024.10.14 දිනට ඉහත සුදුසුකම් සපුරා ඇති නිලධාරීන් මේ සමඟ අමුණා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් අදාළ අධීක්ෂණ නිලධාරියා මඟින් සහතික කරවා ගෙන, අයදුම්පත බහා එවනු ලබන ලිපි කවරයේ ඉහළ වම් කෙළවර "ප්‍රධාන සංරක්ෂණ නිලධාරී (අධිලේඛන/ ශ්‍රව්‍ය දෘශ්‍ය) තනතුර සඳහා අයදුම් කිරීම" යනුවෙන් සඳහන් කර ජාතික ලේඛනාගාර අධ්‍යක්ෂ ජනරාල්, අංක 07, පිලිප් ගුණවර්ධන මාවත, කොළඹ 07 යන ලිපිනයට 2024.10.14 දිනට පෙර ලැබෙන සේ එවිය යුතු ය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ලේකම්,
බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
දිනය : 2024.09.09

**ආදර්ශ අයදුම්පත්‍රය**

| |
|---|
| |

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

**<u>ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ පළමු (I) වන ශ්‍රේණියේ (අධිලේඛන / ශ්‍රව්‍ය දෘශ්‍ය) සංරක්ෂක නිලධාරීන් සේවා පළපුරුද්ද හා කුසලතාවය මත විශේෂ ශ්‍රේණියට උසස් කිරීම</u>**

අයදුම් කරන තනතුර

| තේරීම | තනතුරු අංකය |
|---|---|
| 1 | |
| 2 | |

(අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ 01 ඡේදයට අනුව අංක යොදන්න.)

1. සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : ..................................................................................................
   ........................................................................................................................................................
   (උදා: HERATH MUDIYANSELAGE SAMAN RATHNAYAKA)

2. මුලකුරු සමඟ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : ..........................................................................................
   (උදා: H.M.S. RATHNAYAKA)

3. සම්පූර්ණ නම (සිංහලෙන්) : ...................................................................................................................
   ........................................................................................................................................................

4. ස්ත්‍රී/පුරුෂ භාවය : ස්ත්‍රී ☐ පුරුෂ ☐

5. උපන් දිනය : වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

6. ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

7. දැනට දරනු ලබන නිත්‍ය තනතුර පිළිබඳ විස්තර : පදවි නාමය : ...............................................................
   ශ්‍රේණිය : .............................................................................
   තනතුර අයත් සේවය :...................................................................

8. ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I ශ්‍රේණියට පත් වූ දිනය :..............................................................................

9. අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I ශ්‍රේණියේ සේවා කාලය :

   වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

10. නියමිත කාර්යක්ෂමතා කඩඉම සමත් දිනය : .................................................

ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්, ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ අධිලේඛන/ශ්‍රව්‍ය දෘශ්‍ය සංරක්ෂණ විෂය ක්ෂේත්‍රයේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික (MN-03) සේවා ශ්‍රේණියේ I වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර හය (06) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර හා නියමිත වැටුප්

වර්ධක හය (06) ම උපයාගෙන ඇති බවත්, එම සේවා ශ්‍රේණියෙහි I වන ශ්‍රේණියට නියමිත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්ව ඇති බවත් ප්‍රකාශ කරමි.

දිනය : .............................

අයදුම්කරුගේ අත්සන : ........................................

අත්සන සහතික කිරීම

මාගේ කාර්යාලයේ නිලධාරියෙකු/ නිලධාරිනියක සහ මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන ........................... ........................................................................................................... මහතා/ මහත්මිය/ මෙනවිය .............................. දින මා ඉදිරිපිට දී අත්සන් කළ බව සහතික කරමි.

දිනය : .................................

....................................................

අත්සන සහතික කරන්නාගේ අත්සන

නිල මුද්‍රාව :

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය සහ සහතිකය**

I. මෙම අයදුම්කරු සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගෙන හෝ ගැනීමට අදහස් කර නොමැති බවත්,

II. ඔහු/ ඇය ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ අධිලේඛන/ශ්‍රව්‍ය දෘශ්‍ය සංරක්ෂණ විෂය ක්ෂේත්‍රයේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික (MN-03) සේවා ශ්‍රේණියේ I වන ශ්‍රේණියේ අවම වශයෙන් වන වසර හය (06) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර හා නියමිත වැටුප් වර්ධක හය (06) ම උපයාගෙන ඇති බවත්,

III. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 1/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොමැති බවත්,

IV. අනුමත කාර්ය සාධන ඇගයීමේ පටිපාටියට අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර හය (06) තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර ඇති බවත්,

V. අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික (MN-03) සේවා ශ්‍රේණියෙහි I වන ශ්‍රේණියට නියමිත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්ව ඇති බවත්,

VI. ඒ අනුව, ඔහු/ඇය මෙම පරීක්ෂණයට පෙනී සිටීමට අවශ්‍ය මූලික සුදුසුකම් සපුරා ඇති බවත් සහතික කරමි.

දිනය : .................................

.................................................

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන

නිල මුද්‍රාව :